

පූජ්‍ය යක්කඩුවේ ධර්මකීර්ති ප්‍රඥාරාම හිමි

උපකුලපති

Ven. Yakkaduwe Dharmakeerthi Sri Pragnarama Thero

Vice Chancellor

1966.11.01 - 1968.12.31

## යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමියෝ

මහාචාර්ය කුලතිලක කුමාරසිංහ

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ දෙවන උපකුලපති ධුරයට පත් වූයේ මහා භාෂා ශාස්ත්‍ර පඬිරුවනක් වූ යක්කඩුවේ ප්‍රඥාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. 1965 සිට 1967 දක්වා කෙටි කාලයක් උපකුලපති ලෙස සේවය කරන ලදි. විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමේ දී ක්‍රියාත්මක වූ පනතට අනුව විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය භික්ෂූන් වහන්සේ කෙනෙකුට ම මිස ගිහියකුට නොපැවරේ. එහෙත් 1965 දී බලයට පත් වූ රජයේ අධ්‍යාපන ඇමතිවරයා ඉදිරිපත් කළ පනතකින් කලින් පැවති පනත අවලංගු කර සඟ සතු පිරිවෙන් භූමියේ සංඝාධිපත්‍යය නැති කර දැමීය.

උපකුලපති වීමට පෙර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ මහාචාර්ය ධුරය දැරූයේ ද යක්කඩුවේ නායක හාමුදුරුවෝ ය. කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුරට පත්වීමෙන් හිස් වූ විද්‍යාලංකාර පරිවේණාධිපති ධුරයට පත් වූයේ යක්කඩුවේ නාහිමියෝ ය. 1934 වර්ෂයේ සිට ම පිරිවෙනේ අධ්‍යක්ෂ ධුරය හොබවන ලද්දේ ද උන්වහන්සේ විසිනි. දීර්ඝ කාලයක් මුළුල්ලේ පිරිවෙනේ නඩත්තුවත්, ගොඩනැඟිලි නිර්මාණයත් උන්වහන්සේ විසින් ම කරවන ලදි. දෙමටගොඩ හා පන්නිපිටිය යන විද්‍යාලංකාර පිරිවෙන් දෙකේ සියලු ගොඩනැඟිලි කරවන ලද්දේත් උන්වහන්සේ විසිනි. පිරිවෙන විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය වීමෙන් පසු එහි පරිපාලන ව්‍යුහයත්, අධ්‍යයන ව්‍යුහයත්, යන දෙඅංශය ම සංවිධානය කිරීමේ කටයුතු සඳහා යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමියන්ගේ උපදෙස් හා අත්දැකීම් බෙහෙවින් ඉවහල් විය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය දේශදේශාන්තර ප්‍රචලිත විද්‍යායතනයක් බවට පරිවර්තනය කිරීමට යක්කඩුවේ හිමියන්ගේ භාෂා ශාස්ත්‍ර දැනුමත්, බුද්ධි පාටවයත් තුඩු දුන් බව අමුතුවෙන් කිවයුතු නොවේ.